# ආයුර්වේද දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
# ஆயுர்வேத திணைக்களம் – வட மத்திய மாகாணம்
# Department of Ayurveda - North Central Province

**ධර්මපාල මාවත, අනුරාධපුර.**
தர்மபால மாவததை, அநுராதபுரம்.
Dhrmapala Mawatha, Anuradhapura.


ඔබේ අංකය / உமது இல. / Your No: | මගේ අංකය / எனது இல. / My No: උමැප/ආයු/ආ/07/02/06/02/2023 | දිනය / திகதி / Date: 2024-03-22

සියලුම ආයතන ප්‍රධානීන් වෙත,

<u>**උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරුවල III වන ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීම.**</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මා වෙත යොමු කර ඇති පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක NCP/PSC/3/3/29 හා 2024.03.20 දිනැති ලිපිය මගින් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරුවල III වන ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දන්වා ඇත.

02. ඒ අනුව, අදාළ දැන්වීම සහ ආදර්ශ අයදුම්පත මේ සමඟ යොමු කරන අතර ඒ සඳහා අයදුම් කිරීමට ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලය දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

03. තවද, අදාළ දැන්වීම සහ ආදර්ශ අයදුම්පත මෙම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස බාගත කර ගැනීමට ද හැකියාව පවතින අතර ඒ පිළිබඳව ද ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලය දැනුවත් කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

04. එසේම සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කිරීමේදී ආයතන ප්‍රධානියාගේ ආවරණ ලිපියක් සහිතව උපලේඛන ගත කර 2024.04.24 දින හෝ එදිනට පෙර මා වෙත යොමු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

**වෙබ් අඩවිය - ayudeptncp.lk**

2024/03/22

(වෛද්‍ය පි.එම් ගොඩගේ),
පළාත් ආයුර්වේද කොමසාරිස් (රා.ආ).
පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව,
උතුරු මැද පළාත.

**වෛද්‍ය ප්‍රියානි මල්කාන්ති ගොඩගේ**
**පළාත් ආයුර්වේද කොමසාරිස් (රා.ආ.)**
**වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය**
**පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**
**උතුරු මැද පළාත**
**අනුරාධපුරය**


කාර්යාලය / அலுவலகம் / Office: 025-2225397 | ගිණුම් අංශය / கணக்கு பிரிவு / Account Section: 025-3138050 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 025-2225397 | කොමසාරිස් / ஆணையாளர் / Commissioner: 025-2225398


CamScanner

## උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීම - (සීමිත) – 2023/2024

උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පවතින පහත සඳහන් තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2024.04.24** වේ.

**02. පුරප්පාඩු සංඛ්‍යාව**

| <u>තනතුර</u> | <u>පුරප්පාඩු සංඛ්‍යාව</u> |
|---|---|
| සුළු සේවා පාලක | 02 |
| උපස්ථායක | 02 |
| උපස්ථායිකා | 06 |
| ඖෂධ සංයෝජක | 01 |

**03. සුදුසුකම් :-**

**3.1** අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයන් හයකින් (06) කින් සමත්ව තිබීම.

**සංලක්ෂය**

සීමිත බඳවා ගැනීමේදි 2006.01.01 දිනට පෙර ආයුර්වේද දෙපාර්තමේන්තුවේ PL-1 වැටුප් කේත අංකය යටතේ ස්ථිර තනතුරක සේවය කළ සේවකයින් සඳහා පමණක් ඉහත අධ්‍යාපන සුදුසුකම 8 සමත් ලෙස සැළකේ.

**3.2** කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**3.3** පළපුරුද්ද :-

(i) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.4** වෙනත් සුදුසුකම් :-

(I) අයදුම්පත් කැඳවන දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ස්ථිර තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(II) සේවය ස්ථිර කර තිබීම.

(III) පූර්වාසන්නතම වසර (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(IV) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**3.5** වයස් සීමාව :-

අවම වයස් සීමාව අවුරුදු 18 වන අතර උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ. (දැනටමත් උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර තනතුරු දරණ අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.)

CamScanner

**04.** බඳවා ගැනීමේ ක්‍රමය :-
වෘත්තිය පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

**4.1** වෘත්තීය පරීක්ෂණය (ඇමුණුම 01)

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රතිශතය |
|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | 50 | 40% |

**4.1.1** පවත්වනු ලබන බලධරයා - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**4.2** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (ඇමුණුම 02-

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රතිශතය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | 40% |
| අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | 50 | |

**4.2.1** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට අපේක්ෂකයින් විසින් තම සුදුසුකම් ප්‍රමාණවත් පරිදි තහවුරු කළ යුතුය.

**05.** තනතුරට අදාළ වැටුප් ක්‍රමය :-
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට අනුව වැටුප් කේත අංක PL 02-2016 යටතේ වැටුප් පරිමාණය රු. 25,250 - 10 x 270 – 10 x 300 – 10 x 330 – 12 x 350 – 38,450 /- වේ. මීට අමතරව අනුමත ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනා ද මාසිකව ගෙවනු ලැබේ.

**06.** අයදුම්පත් ඉදිරිපත් කිරීම
**I ඉල්ලුම් කල යුතු ක්‍රමය :-**
මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව තම අයදුම්පත (ඇමුණුම 01) 12"x8" ප්‍රමාණයේ කඩදාසියක (A4) ස්වකීය අත් අකුරුවලින් සම්පූර්ණ කර (අවශ්‍ය වුවහොත් කඩදාසියේ දෙපැත්ත භාවිතා කළ හැක.) අයදුම්කරු විසින් තම ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

**II ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු අන්දම :-**
(අ) අදාළ අයදුම්පත් ආවරණ ලිපියක් සහිතව ආයතන ප්‍රධානියා මඟින් පළාත් ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු අතර, පළාත් ආයුර්වේද කොමසාරිස් විසින් පෞද්ගලික ලිපි ගොනු වල විස්තර සමඟ සසඳා බලා පරීක්ෂා කර නිවැරදි බවට සහතික කර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් මඟින්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2024.04.24** වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඇ) නියමිත ආකෘතියට අනුකූලව සකස් නොකල අයදුම්පත්/ අසම්පූර්ණ අයදුම්පත්/ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් හා මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සැම අතින්ම සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට පමණක් වෘත්තිය පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

CamScanner

**07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන අයදුම්කරු දැනට සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතුයි.

**08. සේවයේ නියුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි :-**

**8.1** මෙම තනතුර ස්ථිරය දැනටමත් විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම්, විශ්‍රාම වැටුප් සහිතය. එසේ නොමැති නම් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. එසේවුවද විශ්‍රාම වැටුප් ගෙවීම වරින් වර රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව වෙනස් වේ. එක් අවුරුදු වැඩ බැලීමේ හෝ අධීක්ෂණ කාලයකට යටත් විය යුතුය. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, උතුරු මැද පළාත් විනය කාර්ය සංග්‍රහයේ විධිවිධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, පළාත් මූල්‍ය රීති, දෙපාර්තමේන්තු නියෝග, රජය හා පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නියමයන් හා රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

**8.2** බඳවා ගනු ලබන පත්වීම් ලාභීන් අනුමත බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධානයන්ට යටත් වේ.

**8.3** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

**09. විශේෂ කරුණු**

**9.1** අයදුම්කරුවෙකු එක් තනතුරකට වඩා වැඩි තනතුරු සංඛ්‍යාවකට ඉල්ලුම් කරන විට එක් එක් තනතුර සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුයි.

**9.2** පිළිගත් අයදුම්පත්වලට අදාළ අපේක්ෂකයින් වෘත්තීය පරීක්ෂණයකට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. අදාළ දිනය, වේලාව හා ස්ථානය දැනුම් දෙන අතර, නියමිත දිනට හා වේලාවට ඒ සඳහා පෙනී සිටිය යුතුය. අදාළ සුදුසුකම් සම්මුඛ පරීක්ෂණයේදී සනාථ කළ යුතු අතර, පසුව ඒ සඳහා අවස්ථාව දෙනු නොලැබේ.

**9.3** බඳවා ගනු ලබන සෑම පුද්ගලයෙක්ම පළාත තුළ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම ආයතනයක සේවයට බැඳී සිටින අතර, කුසලතා අනුපිළිවෙලේ ප්‍රමුඛතාවයට අනුව සේවා අවශ්‍යතාවය සැළකිල්ලට ගෙන, පුරප්පාඩු සේවා ස්ථාන වෙත පත් කිරීම සිදු කරනු ලැබේ.

**9.4** ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන තොරතුරු, අසත්‍ය හෝ සදොස් සහිත බවට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් තෝරාගැනීමට නුසුදුස්සෙකු වන අතර, තෝරා ගැනීමෙන් පසුව කුමන අවස්ථාවකදී හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමටද යටත්වනු ඇත.

**9.5** මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය ද පවතින පුරප්පාඩු වලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය ද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2024.03.20

CamScanner

## උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා සීමිත බඳවා ගැනීමට අදාළ වෘත්තීය පරීක්ෂණය

01. පරීක්ෂණයේ නම - ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා සීමිත අයදුම්කරුවන් බඳවා ගැනීමේ වෘත්තීය පරීක්ෂණය

02. වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර

සුළු සේවා පාලක තනතුරු සඳහා

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| සේවකයන්ගේ පැමිණීම සම්බන්ධ වාර්තා සකස් කිරීමේ හැකියාව | 20 |
| සුළු සේවකයන් නියමිත ස්ථාන වල රාජකාරියේ යෙදවීමේ හැකියාව | 20 |
| සේවකයන්ගේ රාජකාරි සම්බන්ධ සුළු ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව | 10 |

උපස්ථායක / උපස්ථායිකා තනතුරු සඳහා

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| රෝගීන් සම්බන්ධව කටයුතු කිරීමේ හැකියාව | 15 |
| රෝගීන්ට උපස්ථාන කිරීම පිළිබඳ දැනුම | 25 |
| ඖෂධ සම්බන්ධ දැනුම හා ඖෂධ භාවිතය සම්බන්ධ මූලික දැනුම | 10 |

ඖෂධ සංයෝජක තනතුර සඳහා

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| ඖෂධ සංයෝජනය කිරීමේ හැකියාව | 20 |
| ඖෂධ අසුරා තැබීම හා ආරක්ෂා කිරීම පිළිබඳ දැනුම | 20 |
| ඖෂධ නිකුත් කිරීම සම්බන්ධ දැනුම | 10 |

CamScanner

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීම ( සීමිත ) – 2023/2024**

**ආදර්ශ අයදුම්පත්‍රය**

අයදුම් කරනු ලබන තනතුර ..............................................................................................

01. i. මුලකුරු සමඟ නම (මුලකුරු අගට යොදා) ..........................................................................
..............................................................................................
..............................................................................................
(උදා - සුනිල්, ඒ. බී.)

ii. මුලකුරු වලින් හැඳින්වෙන නම ..............................................................................
..............................................................................................
..............................................................................................

02. ස්ථිර ලිපිනය ..............................................................................................
..............................................................................................
..............................................................................................

03. වර්ථමාන සේවා ස්ථානය හා එහි ලිපිනය ..............................................................................
..............................................................................................
..............................................................................................

04. දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

05. (i) ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(ii) උපන් දිනය

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට (2024.04.24 ) වයස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අවු. | | | මාස | | | දින | | |

(iv) ස්ත්‍රී / පුරුෂභාවය　　පුරුෂ - 0　ස්ත්‍රී - 1　☐　(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(v) විවාහක / අවිවාහක බව　　විවාහක - 2　අවිවාහක - 1　☐　(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. සේවා විස්තරය

I. ස්ථිර මුල් පත්වීමේ තනතුර ..............................................................................
II. ස්ථිර මුල් පත්වීමේ දිනය..............................................................................

CamScanner

III. සේවය ස්ථිර කිරීමේ දිනය ..........................................................................................

IV. දැනට දරණ තනතුර..........................................................................................

V. දැනට දරණ තනතුරට පත්වූ දිනය ..........................................................................................

VI. දැනට දරණ තනතුර ස්ථිරද යන වග ..........................................................................................

VII. දැනට දරන තනතුරේ සේවය ස්ථිර කර ඇත්නම් එම ලිපියේ යොමු අංකය හා දිනය:-

..........................................................................................

VIII. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ස්ථිර තනතුරේ / තනතුරු වල සම්පූර්ණ සේවා කාලය :-

| අවු. | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|

07. අධ්‍යාපන සුදුසුකම්

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :-

පළමු වර

වර්ෂය :-......................     විභාග අංකය:-................................

| විෂයයන් | සාමාර්ථය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|---|
| 1. ........................... | ................................ | 5.......................... | ..................... |
| 2. ........................... | ................................ | 6.......................... | ..................... |
| 3. ........................... | ................................ | 7.......................... | ..................... |
| 4. ........................... | ................................ | 8.......................... | ..................... |

දෙවන වර

වර්ෂය :-............................     විභාග අංකය:-................................

| විෂයයන් | සාමාර්ථය | විෂයයන් | සාමාර්ථ |
|---|---|---|---|
| 1. ........................... | ................................ | 5.......................... | ..................... |
| 2. ........................... | ................................ | 6.......................... | ..................... |
| 3. ........................... | ................................ | 7.......................... | ..................... |
| 4. ........................... | ................................ | 8.......................... | ..................... |

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :-

වර්ෂය :-............................     විභාග අංකය:-...................................

| විෂයයන් | සමාර්ථය | විෂයයන් | සමාර්ථ |
|---|---|---|---|
| 1. ........................... | ................................ | 3.......................... | ..................... |
| 2. ........................... | ................................ | 4.......................... | ..................... |

08. වෙනත් සුදුසුකම්

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

CS CamScanner

09. අයදුම්කරුගේ සහතිකය.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි. නිවේදනයේ සඳහන් පරිදි අයදුම් කිරීමට මා සුදුසුකම් ලබා ඇති බවද, අසත්‍ය තොරතුරු සපයා ඇති බවට සේවයට බඳවා ගැනීමෙන් පසු කුමන හෝ අවස්ථාවකදී සනාථ වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම පිළිගනිමි.

දිනය:- ....................                ..................................................................

අයදුම්කරුගේ අත්සන

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. ( දැනට සේවය කරන ආයතන ප්‍රධානියා විසින් අත්සන සහතික කළ යුතුයි. )

මෙම ආයතනයේ ........................................................................... ( තනතුර ) ලෙස සේවය කරන ................................................................................................ මයා/මිය/මෙනවිය ................................ දින සිට මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවයේ යෙදෙන අතර, ............................................ දින සිට මෙම ආයතනයේ සේවය කරයි. ඔහු / ඇය විසින් ................................ දින මා ඉදිරියේදී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

.......................................................

(ආයතන ප්‍රධානියාගේ අත්සන)

නම හා පදවි නාමය :- ...........................................................

ලිපිනය :-.............................................................

(නිල මුද්‍රාව) :-.............................................................

දිනය :-.............................................................

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

............................................... ආයතනයේ ............................................................... තනතුර දරණ ........................................................................... මයාගේ / මියගේ / මෙනවියගේ අයදුම්පත් ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙමදෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ ස්ථිර තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන ඇත. ඔහුගේ / ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක / නොහැක.

.......................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

නම හා පදවි නාමය :- ...........................................................

ලිපිනය :-.............................................................

(නිල මුද්‍රාව) :-.............................................................

දිනය :-.............................................................

CamScanner

ඇමුණුම - 2 - 9

21 MAR 2024

**උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ 7.3.4.2 වගන්තියට අනුව, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සවිස්තරාත්මක ලකුණු පටිපාටිය**

**02.** තනතුර - සුළු සේවා පාලක

2.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු ප්‍රමාණය (25)

| ලකුණු ලබා දෙන නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. අ.පො.ස. (උ.පෙළ) මට්ටමෙන් ඉහළ අධ්‍යාපනය (ඩිප්ලෝමා)** | 10 |
| 02. අ.පො.ස. (උ.පෙළ) මට්ටමෙන් ඉහළ අධ්‍යාපනය (සහතික පත්‍ර පාඨමාලා)** | 08 |
| 03. අ.පො.ස. (උ.පෙළ) විෂයයන් 03කින් සමත්ව තිබීම | 07 |
| **මුළු ලකුණු** | **25** |

** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මඟින් ක්ෂේත්‍රයට අදාලව හදාරා ඇති ඩිප්ලෝමා / සහතිකපත්‍ර පාඨමාලාවක් වීම.

2.2 අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද - උපරිම ලකුණු ප්‍රමාණය (20)

| ලකුණු ලබා දෙන නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. රජයේ සේවයේ ස්ථිර තනතුරක සේවා කාලය වෙනුවෙන් වසරකට ලකුණු (01) බැගින් උපරිම වසර 10ක් දක්වා | 10 |
| 02. රජයේ හෝ රජයේ පිළිගත් පුද්ගලික ආයතනයක තනතුරට අදාලව ලබා ඇති පළපුරුද්ද වෙනුවෙන් මසකට ලකුණු 0.8 බැගින් අවම මාස 03 සිට උපරිම වසර 01 දක්වා<br>මාස 03 – උපරිම ලකුණු 2.5<br>මාස 06 - උපරිම ලකුණු 05<br>අවු. 01 - උපරිම ලකුණු 10 | 10 |
| **මුළු ලකුණු** | **20** |

2.3 සම්මුඛ පරීක්ෂණ කුසලතාවය - උපරිම ලකුණු ප්‍රමාණය (05)

| ලකුණු ලබා දෙන නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. සන්නිවේදන හැකියාව | 03 |
| 02. පෞරුෂත්වය | 01 |
| 03. ඉදිරිපත් කිරීමේ හැකියාව | 01 |
| **මුළු ලකුණු** | **05** |

CamScanner

ඇමුණුම - 02

<u>උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ 7.3.4.2 වගන්තියට අනුව, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සවිස්තරාත්මක ලකුණු පටිපාටිය</u>

**04.** තනතුර - උපස්ථායක/ උපස්ථායිකා

4.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු ප්‍රමාණය (25)

| ලකුණු ලබා දෙන නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. අ.පො.ස. (උ.පෙළ) මට්ටමෙන් ඉහළ අධ්‍යාපනය (ඩිප්ලෝමා)** | 10 |
| 02. අ.පො.ස. (උ.පෙළ) මට්ටමෙන් ඉහළ අධ්‍යාපනය (සහතික පත්‍ර පාඨමාලා)** | 08 |
| 03. අ.පො.ස. (උ.පෙළ) විෂයයන් 03කින් සමත්ව තිබීම | 07 |
| මුළු ලකුණු | **25** |

** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මඟින් ක්ෂේත්‍රයට අදාලව හදාරා ඇති ඩිප්ලෝමා / සහතිකපත්‍ර පාඨමාලාවක් වීම.

4.2 අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද - උපරිම ලකුණු ප්‍රමාණය (20)

| ලකුණු ලබා දෙන නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. රජයේ සේවයේ ස්ථිර තනතුරක සේවා කාලය වෙනුවෙන් වසරකට ලකුණු (01) බැගින් උපරිම වසර 10ක් දක්වා | 10 |
| 02. රජයේ හෝ රජයේ පිළිගත් පුද්ගලික ආයතනයක තනතුරට අදාලව ලබා ඇති පළපුරුද්ද වෙනුවෙන් මසකට ලකුණු 0.8 බැගින් අවම මාස 03 සිට උපරිම වසර 01 දක්වා<br>මාස 03 – උපරිම ලකුණු 2.5<br>මාස 06 - උපරිම ලකුණු 05<br>අවු. 01 - උපරිම ලකුණු 10 | 10 |
| මුළු ලකුණු | **20** |

4.3 සම්මුඛ පරීක්ෂණ කුසලතාවය - උපරිම ලකුණු ප්‍රමාණය (05)

| ලකුණු ලබා දෙන නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. සන්නිවේදන හැකියාව | 03 |
| 02. පෞරුෂත්වය | 01 |
| 03. ඉදිරිපත් කිරීමේ හැකියාව | 01 |
| මුළු ලකුණු | **05** |

CamScanner

21 MAR 2024

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ 7.3.4.2 වගන්තියට අනුව, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සවිස්තරාත්මක ලකුණු පටිපාටිය

### 7.3.4.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | 40%* |
| අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |

* මුළු ලකුණු ප්‍රමාණයෙන් (ලකුණු 50) ලකුණු 20ක් ලබා ගැනීම සමත් ලෙස සැළකේ.

### 01. තනතුර - ඖෂධ සංයෝජක

1.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු ප්‍රමාණය (25)

| ලකුණු ලබා දෙන නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. අ.පො.ස. (උ.පෙළ) මට්ටමෙන් ඉහළ අධ්‍යාපනය (ඩිප්ලෝමා)** | 10 |
| 02. අ.පො.ස. (උ.පෙළ) මට්ටමෙන් ඉහළ අධ්‍යාපනය (සහතික පත්‍ර පාඨමාලා)** | 08 |
| 03. අ.පො.ස. (උ.පෙළ) විෂයයන් 03කින් සමත්ව තිබීම | 07 |
| මුළු ලකුණු | 25 |

** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මඟින් ක්ෂේත්‍රයට අදාලව හදාරා ඇති ඩිප්ලෝමා / සහතිකපත්‍ර පාඨමාලාවක් වීම.

1.2 අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද - උපරිම ලකුණු ප්‍රමාණය (20)

| ලකුණු ලබා දෙන නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. රජයේ සේවයේ ස්ථිර තනතුරක සේවා කාලය වෙනුවෙන් වසරකට ලකුණු (01) බැගින් උපරිම වසර 10ක් දක්වා | 10 |
| 02. රජයේ හෝ රජයේ පිළිගත් පුද්ගලික ආයතනයක තනතුරට අදාලව ලබා ඇති පළපුරුද්ද වෙනුවෙන් මසකට ලකුණු 0.8 බැගින් අවම මාස 03 සිට උපරිම වසර 01 දක්වා<br>මාස 03 – උපරිම ලකුණු 2.5<br>මාස 06 - උපරිම ලකුණු 05<br>අවු. 01 - උපරිම ලකුණු 10 | 10 |
| මුළු ලකුණු | 20 |

1.3 සම්මුඛ පරීක්ෂණ කුසලතාවය - උපරිම ලකුණු ප්‍රමාණය (05)

| ලකුණු ලබා දෙන නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. සන්නිවේදන හැකියාව | 03 |
| 02. පෞරුෂත්වය | 01 |
| 03. ඉදිරිපත් කිරීමේ හැකියාව | 01 |
| මුළු ලකුණු | 05 |

CamScanner